# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2345/63 – 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/89.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.05.06 දිනැති හා අංක 2226/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, ඇරැව්වල පාර, අංක 278/6- සී හි පදිංචි ඩබ්.පී.කේ. වික්‍රම මයා (එච්. ජයන්ත පෙරේරා බාරේ) සහ කොළඹ 15, රොක් හවුස් පටුමඟ, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.07.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: A/55/ 2021.
1R /COM/04/2018/89.

ඩබ්ලිව්.පී.කේ. වික්‍රම මයා,
එච්.ජයන්ත පෙරේරා බාරේ,
නො. 278/6 සී,
ඇරැව්වල පාර,
පන්නිපිටිය.

*පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක් හවුස් පටුමඟ,
කොළඹ 15.

*දෙවැනි පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කරන ඩබ්ලිව්. පී. කේ. වික්‍රම මහතාට

(1) ආයතනය විසින් 2001.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති ස්ථිර පත්වීම් ලිපියට අනුව සුදුසු ශ්‍රේණියකට පත් නොකිරීමෙන්ද
(2) 2006.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති විදුලි අධිකාරි තනතුරට අදාළ වැටුප එදින සිට ලබා නොදීමෙන්ද

අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ."

පරීක්ෂණයේ පළමු දිනය වූ 2022.01.27 දින දෙවන පාර්ශ්වය වූ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජනයක් නොමැති වූ අතර දෙවැනි දින එනම් 2022.02.21 දින පැමිණ ප්‍රකාශ කරන ලද්දේ සියලුම නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳව සළකා බලා තීරණයක් ලබා දීමට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව කටයුතු කරන හෙයින් මෙම ආරාවුලට අදාළ ගැටලුවද විසඳීමට පියවර ගන්නා බවයි. ඒ සඳහා අවස්ථාව සළසා දෙමින් පරීක්ෂණ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලද නමුත් නියමිත කාලය තුළ අභියාචනා පරීක්ෂණ සිදුකර දෙවන පාර්ශ්වය විසින් වාර්තාවක් ලබානොදීම මත බේරුම්කරණ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය කරන ලදී.

පැමිණිලිකරු 1999.07.20 දින ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ විදුලි පරිපාලක වශයෙන් මාස තුනක කාලයක් සඳහා කොන්ත්‍රාත්

පදනම මත සේවය කර ඇත. පසුව 1999.10.19 දින සිට 2002.10.19 දින දක්වා වසර තුනක කාලයකට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. පසුව 2001.11.01 දින සිට වැඩ මූලික (විදුලි) තනතුරේ සේවය ස්ථිර කර ඇත.

අංක සීඑෆ්එච්සී/ඒඩී/පීඑෆ්/456 හා 2001.11.26 දින දරන එකී පත්වීම් ලිපියේ මෙසේ සඳහන්ව ඇත. "ඔබගේ සුදුසුකම් හා පලපුරුද්ද මත සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව මෙම තනතුරේ සුදුසු ශ්‍රේණියකට ඔබව පත් කරනු ඇත.'' පැමිණිලිකරුගේ එක් දුක්ගැනවිල්ලක් වන්නේ ඉහත වගන්තිය අනුව කටයුතු කර සුදුසු ශ්‍රේණියකට පත් නොකිරීම නිසා ඔහුට අසාධාරණයක් සිදුව ඇති බවයි.

ඉහත වගන්තියෙන් කියවෙන කරුණු අනුව පැහැදිලිව පෙනී යන දෙය නම් එහි කියවෙන පරිදි නිලධාරියාට සුදුසු ශ්‍රේණියක් ලබාදීම අනිවාර්යයෙන් ලබාදෙන බවට බැඳීමක් නොමැති බවයි. නිලධාරියා සම්මුඛ පරීක්ෂණයකට මුහුණදිය යුතු අතර එහිදී නිලධාරියාගේ සුදුසුකම් හා පලපුරුද්ද මත ලබා ගන්නා ලකුණු අනුව තෝරා ගැනීමකින් පසුව පමණක් එවැනි ශ්‍රේණිගත කිරීමකට ඉඩ ඇති බව එම වගන්තියෙන් කියවේ. ඒ අනුව සේවකයෙකුට තමා අවශ්‍යයෙන්ම ඉහල ශ්‍රේණියක පිහිටුවා වැටුප් ලබාදිය යුතුයැයි ඉල්ලා සිටීමේ අයිතියක් එමගින් නිර්මාණය බව මට තහවුරු නොවේ. තවදුරටත් මේ පිළිබඳව සළකා බැලීමේදී මෙම පැමිණිලිකරු තමාට ලැබුන 2001.11.26 දින දරන පත්වීම් ලිපිය හා සම්බන්ධ ගැටලුව පිළිබඳව කාර්මික අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කරනුයේ 2021 වසරේදීය. අවුරුදු විස්සක් තරම් කාලයක් නිහඬව සිටි පැමිණිලිකරු වෙනත් දුක්ගැනවිල්ලක් පැමිණිල්ලක් ලෙස ඉදිරිපත් කිරීමේදී එම කරුණට වැඩිදුරටත් සහාය ලබාගැනීම සඳහා තමාට පත්වීම් ලිපියෙන් දැන් පොරොන්දුවක් ඉටුකර නොමැති බවද කියා සිටීමට උත්සාහ දරන බව මට පැහැදිලි වේ. මෙම ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාව වන විට පැමිණිලිකරු අවුරුදු විස්සකට ආසන්න කාලයක් එම පත්වීම් ලිපිය මත සේවය කර ඇති අතර සේවා උසස්වීම් කිහිපයක්ද ලබා ඇත. එකී පත්වීම් ලිපිය අනුව තමාට ලැබිය යුතු ශ්‍රේණිගත කිරීමක් ලැබී නොමැති බව අවුරුදු විස්සකට පසුව ප්‍රකාශ කර සහනයක් ඉල්ලා සිටීම පැමිණිලිකරුගේ අනවශ්‍ය ප්‍රමාදයක් ලෙස මට පෙනේ. කාර්මික ආරාවුලක් තමාට හැකි මුල්ම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර යම් අවස්ථාවකදී ඉතා ප්‍රමාද වී දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් ඊට සාධාරණ හේතු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කල යුතුය. පැමිණිලිකරු තම පැමිණිල්ල ඉදිරිපත් කිරීම වසර විස්සක් ප්‍රමාද වීම පිළිබඳව හේතු දැක්වීමක්ද කර නැත. ඒ අනුව විසඳිය යුතු පළමු ප්‍රශ්නය සම්බන්ධයෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී නොමැති බව තීරණය කරමි.

විසඳිය යුතු දෙවැනි ප්‍රශ්නය වනුයේ ඩබ්ලිව්.පී. කේ. වික්‍රම මහතාට ආයතනය විසින් 2006.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති විදුලි අධිකාරී තනතුරට අදාළ වැටුප එදින සිට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්නයි.

සේවක දුක්ගැනවිලි පිළිබඳව සළකා බැලීමට පත් කරන ලද කමිටුවේ නිර්දේශ අනුව පැමිණිලිකරුට 2006.11.01 දින ක්‍රියාත්මක වන පරිදි විදුලි අධිකාරී තනතුරේ (රු.157,500- 15 x 3,780 - 214,200 වැටුප් පරිමාණයේ මාසික වැටුප රු. 13,125/= ) පිහිටුවා පත්වීම් ලිපියක් නිකුත්කර ඇත. එහෙත් එම පත්වීම ක්‍රියාත්මක කර නැත.

පසුව සේවක දුක්ගැනවිලි පිළිබඳව සළකා බැලීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව සේවකයින් ශ්‍රේණිගත කිරීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව පැමිණිලිකරුට 2008.06.01 දින ක්‍රියාත්මක වන පරිදි විදුලි අධිකාරී තනතුරේ (රු. 19755- 15 X 325 - 11 X 400 - 29030 වැටුප් පරිමාණයේ මාසික වැටුප රු. 20,405/=) පිහිටුවා පත්වීම් ලිපියක් නිකුත්කර ඇත. එම පත්වීම ක්‍රියාත්මක කර ඇත.

පැමිණිලිකරුගේ ඉල්ලීම වන්නේ 2006.11.01 දින ලබාදී ඇති පත්වීම් ලිපිය අනුව වැටුප් ගෙවා නැති බැවින් එයින් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇති බවයි. දෙවන පාර්ශ්වය කරුණු දක්වමින් ප්‍රකාශකර සිටින්නේ 2006 සේවක දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යාමේදී සේවකයින් අතර පාලනය කරගත නොහැකි මට්ටමේ අර්බුදකාරී තත්වයක් හටගත් බවයි. සංස්ථාවේ සේවකයෙකු වශයෙන් පැමිණිලිකරුද එම අර්බුදය පිළිබඳව හොඳින්ම දන්නා බව දෙවන පාර්ශ්වයේ ස්ථාවරයයි. පාර්ශ්ව දෙකම තම කරුණු දැක්වීමේදී අංක 2008.07.07 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර කරුණු දක්වා ඇත. එම අංක 2008.07.07 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙහි මෙසේ සඳහන් වේ. "2006 වර්ෂයේ දුක්ගැනවිලි පිළිබඳ සළකා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරන ලදී. එම කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට යාමේදී උද්ගත වූ තත්වය අනුව, එය ක්‍රියාත්මක නොකර නැවත වරක් සළකා බලා සියලුම සේවකයන් ශ්‍රේණිගත කිරීම සඳහා කටයුතු කිරීමට අමාත්‍යංශ ලේකම්වරයා උපදෙස් දෙන ලදී." මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව පැහැදිලි වන්නේ 2006 සේවක දුක් ගැනවිලි කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇත්තේ අමාත්‍යංශ ලේකම්වරයා විසින් බවයි. එසේම අමාත්‍යංශ ලේකම්වරයා උපදෙස් දී ඇත්තේ සියලුම සේවකයන් ශ්‍රේණිගත කිරීම සඳහා නැවත කමිටුවක් පත් කරන ලෙසයි. මෙම ගැටලුව අමාත්‍යංශ ලේකම්වරයා දක්වා ඉහලට ගොස් ඇත්තේ අර්බුදය බරපතල තත්වයක පැවති නිසා බව පෙනේ. මෙම තීරණ කිසිවක් පැමිණිලිකාර නිලධරයාට පුද්ගලිකව එල්ලකරමින් ගන්නා ලද තීරණ නොවන බවත්, සියලුම සේවකයන්ට සාධාරණය ඉටුකරදීම සඳහා ගන්නා ලද තීරණ බවත් පැහැදිලිය. එසේම මෙම ගැටලු සහගත තත්වය පිළිබඳවත්,

එම තීරණ ගන්නා ලද්දේ සියලුම සේවකයන් විසින් කරන ලද ඉල්ලීම නිසා බවත්, එකී නිලධාරි කණ්ඩායමෙහි සාමාජිකයෙකු වූ පැමිණිලිකරු නොදන්නේ යැයි මම නොසිතමි.

2006.10.27 දින දරන 2006.11.01 දින සිට විදුලි අධිකාරී වශයෙන් උසස් වීම ලබාදුන් ලිපියේ විෂය ලෙස සඳහන්ව ඇත්තේ "සේවක දුක්ගැනවිලි පිළිබඳ සළකා බැලීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම" යනුවෙනි. එසේම 2008.07.03 දින දරන 2008.06.01 දින සිට විදුලි අධිකාරි තනතුරේ පිහිටුවා නිකුත් කල ලිපියේ විෂය ලෙස සඳහන්ව ඇත්තේද ''සේවක දුක්ගැනවිලි කමිටු නිර්දේශ අනුව සේවකයින් ශ්‍රේණිගත කිරීම සඳහා පත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කිරීම'' යනුවෙනි. එයින් පැහැදිලි වන්නේ මෙම පත්වීම් අවස්ථා දෙකම පොදුවේ නිලධාරීන් ගනණාවක් වෙනුවෙන් ගන්නා ලද තීරණයක් මිස මෙම නඩුවේ පැමිණිලිකරු අරබයා පුද්ගලිකව ගන්නා ලද තීරණයක් නොවන බවයි.

අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ බහුතර නිලධාරින් පිරිසකගේ යහපත පිනිස ගන්නා ලද පරිපාලනමය. තීරණයකි. සමස්ථ සේවක ගනය සඳහා සාධාරණත්වය ඉටුකර දීම පිනිස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගෙන ඇති තීරණය පැමිණිලිකරුට කරන ලද පුද්ගලික අසාධාරණයක් නොවේ යැයි මම තීරණය කරමි.

මේ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමුකරන ලද විසඳිය යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු පහත පරිදි වේ.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කරන ඩබ්ලිව්. පී. කේ. වික්‍රම මහතාට

(1) ආයතනය විසින් 2001.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති ස්ථිර පත්වීම් ලිපියට අනුව සුදුසු ශ්‍රේණියකට පත් නොකිරීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද ?
පිළිතුර - නැත.

(2) 2006.11.01 දින සිටි ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති විදුලි අධිකාරි තනතුරට අදාළ වැටුප එදින සිට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද ?
පිළිතුර - නැත.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

නීතිඥ කේ.ඒ. තිලකරත්න,
බේරුම්කරු.

2023 ජූලි මස 05 වැනි දින.

EOG 08 - 0192